**චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ චිත්‍රපට සංස්ථාභාරය - 2021**

චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ චිත්‍රපට සංස්ථාභාරයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්වයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38(1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙළ කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රකාශන හැර සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී.

## 2.1 මූල්‍ය ප්‍රකාශන

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මඟින් ඇතුළත් කළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 877 (2)(ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සංස්ථාභාරයේ 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට සකස් කර අවසන් වුවද, භාරකාර මණ්ඩලය සහ අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මකව නොපැවතීම තුළ සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය. | භාරය සඳහා භාරකාර මණ්ඩලයක් පත් කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පියවරගත යුතුය. |

## 2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථාභාරය පනත | | | |
| (i) 3 (1) සහ (2) වගන්ති | භාරයෙහි කළමනාකරණය හා පාලනය සඳහා භාරකාර මණ්ඩලයක් පත්කළ යුතු වුවත්, 2022 වර්ෂය සඳහා මෙම වාර්තාවේ දින දක්වා භාරකාර මණ්ඩලයක් පත්කර නොතිබුණි. | නව භාරකාර මණ්ඩලයක් පත් කිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. | පනතේ වගන්ති අනුව ක්‍රියා කළ යුතුය. |
| (ii) 5 (1) වගන්තිය | චිත්‍රපට කලාකරුවන් හා කාර්මිකයන්ට ආධාර වන පරිදි සැලසුම් කරන ලද සුභසාධන අරමුදල්, ඉතිරිකිරීමේ අරමුදල්, ඉතිරිකිරීමේ හෝ සකසුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම පිහිටුවා නොතිබුණි. | මහා භාණ්ඩාගාරය විසින් මාසික විශ්‍රාම වැටුප් දීමනා පමණක් ගෙවීම් කිරීමට ප්‍රමුඛත්වය දෙමින් මුදල් ලබාදීම යන කරුණු මත දක්වන ලද පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගතව පැවතිණ. | -එම- |
| (iii) 5 (2) (අ) වගන්තිය | සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවන්ට හෝ චිත්‍රපට කාර්මිකයන්ට වයස අවුරුදු 60 ට එළඹීමෙන් පසු ණය, දීමනා, නිවාස පහසුකම් හෝ වෙනත් සමාන ප්‍රතිලාභ ලබාදීමට අවධානය යොමු කර නොතිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (iv) 5 (2) (ආ) වගන්තිය | යම් කායික හෝ මානසික දුබලතාවයකට පත්ව සිය වෘත්තියෙහි යෙදීමට නොහැකිව සිටින සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවන්ට හෝ චිත්‍රපට කාර්මිකයන්ට යම් මුදල් ආධාරයක් පිරිනැමීමට ක්‍රියා කර නොතිබුණි. | -එම- | -එම- |
| (v) 6 (2) (අ) වගන්තිය | අරමුදල් උපයා ගැනීමට සුදුසු වැඩසටහන් හෝ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි. | ප්‍රායෝගික ගැටළු රැසකට මුහුණ පෑමට සිදුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හැකියාවක් නොලැබීම මත අරමුදල් උපයා ගැනීම සඳහා වැඩසටහන් හෝ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට නොහැකි විය. | -එම- |
| (ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1 ඡේදය මඟින් ඇතුළත් කළ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 877(1)(ඇ) | සංස්ථාභාරයේ සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසර ගණනකට පසු නව භාරකාර මණ්ඩලයක් පත්ව එය ක්‍රියාත්මක වීම 2021 ජූලි 06 වන දින සිදු වීම මත ඉතා කෙටි කාලසීමාවක් තුළ අයවැය ලේඛනයක් පිළියෙල කර අනුමත කර ගැනීමට නොහැකි විය. | චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාභාරය විසින් රැස්කරන ආදායම් පදනම් කරගෙන 2021 වර්ෂය දක්වාම විශ්‍රාම වැටුප්ලාභීන් 160 දෙනෙකු වෙනුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම් කර තිබුණි. එසේ වුවද 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අපේක්ෂාවෙන් පොරොත්තු ලේඛනයේ සිටින කලාකරුවන් 72 දෙදෙනෙකු සඳහා සංස්ථාභාරයේ ආදායම ඉහළ නංවාගෙන විශ්‍රාම වැටුප් ලබාදීමට කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි. | පොරොත්තු ලේඛනගත සුදුසුකම්ලාභී චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මික ශිල්පීන් වෙත වාර්ෂික සංස්ථාභාර අරමුදල් තත්ත්වය සලකා බැලීමෙන් අනතුරුව නව විශ්‍රාම වැටුප් ප්‍රදානයන් සිදු කිරීමට පසුගිය වර්ෂයන් තුළ කටයුතු කර ඇත. | පසුගිය වර්ෂ වලදී මෙන්ම පොරොත්තු ලේඛනයේ සිටින කලාකරුවන් වෙතද විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතුය. |